# නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය

**ෂ්‍යාමල් ඉරෝෂණ**[1]

අඛන්ඩව සිදුවන සංවර්ධන ක්‍රියාවලියට සාපේක්ෂව ඉපැරණි මිනිසා විසින් නිර්මිත සියලු උරුමයන් නිරන්තර අභියෝගයට ලක් වෙමින් පවතී. එසේ අභියෝගයට ලක්වන්නේ එකෙකුගෙන් තවෙකෙකු නොව මානව පරම්පරාවේ එක්යුගයක නිර්මිතයන් නූතන මානවයාගේ බලපෑමට වේ. මෙවැනි තත්ත්වයන් ගොඩ නැගෙනුයේ හුදු මිනිසාගේ විනාශ කිරීමේ අවශ්‍යතාව නිසා හෝ සංවර්ධන අවශ්‍යතාව නිසාම නොව ඔවුනොවුන්ගේ කළමණාකරණ හැකියාව ඔවුනටම අභියෝගයක් වී ඇති බැවින. එවැනි තත්ත්වයකට උරුමයන් පත්ව ඇත්තේ වත්මන් මානවයා තම සංවර්ධනයේ අපේක්ෂා වෙතට පමණක් අවධානය යොමුකොට ඇති බැවිනි.

සංවර්ධනය වූ කලී කුමන රටක කුමන ප්‍රදේශයක වුවද මිනිස් අවශ්‍යතා වෙනුවෙන් අනිවාර්යෙන්ම සිදුවිය යුත්තකි. මෙහිදී ප්‍රමුඛත්වය හිමි විය යුත්තේ කවරෙකුටද කුමක් සඳහාද යන්න පිළිබඳව ගැටළුවක් පැනනගී. එය විසඳාගත හැකි මාර්ගය වනුයේ හැකි ඉක්මනින් එම ප්‍රදේශය තුළ සංවර්ධන ක්‍රියාවලින් දියත් කිරීමට පෙර එම ක්‍රියාවලීන් සමඟ මානවයාගේ අතීත ක්‍රියාවලීන් ආරක්ෂාකරමින් වත්මන් පරම්පරාවට පැවරීම කෙසේ කළ යුතුද යන්න හඳුනාගැනීමෙනි. මේ සඳහා අප අනාගත දැක්මකින් යුක්තව සැලැස්මක් සකස්කරගත යුතුය. එහිදී පුරාවිද්‍යා උරුමය කෙසේ කළමනාකරණය කළ යුතු ද යන්න අවබෝධ කරගැනීම උදෙසා ගත යුතු මූලික ක්‍රියාමාර්ග මොනවාද? නැගෙනහිර පළාත තුළ උරුම කළමනාකරණයේදී මුහුණදීමට සිදුවන අත්‍යවශ්‍ය අංගයක් වන උරුම සංරක්ෂණය කළ යුක්තේ කුමන ආචාර ධර්ම මත පිහිටාද යන්න ගැඹුරින් අවධානය යොමු කළ යුතුය. මෙම පත්‍රිකාව ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කරයි.

**ප්‍රමුඛ පදඃ** පුරාවිද්‍යාව, උරුම කළමනාකරණය, සංරක්ෂණය
**Title:** Managing heritage sites in the Eastern Province
**Keywords:** Archaeology, heritage management, conservation

[1] නන්ද එල්ලාවල මාවත, ඇත්ඔය, රත්නපුර.

ඊමේල්: ishayamal@yahoo.com